C
371
ARI

PERMANENT
FOR
LIBRARY

# නව යොවුන්විය පාසල් සිසුන් මුහුණපාන අධ්‍යාපනික ගැටළු නිරාකරණය සඳහා අධ්‍යාපනික මාර්ගෝපදේශය හා උපදේශනය යොදාගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

## (ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ දුම්බර අධ්‍යාපන කලාපය ඇසුරෙනි)

# A STUDY ON HOW COUNSELLING AND GUIDANCE COULD BE USED TO SOLVE PROBLEMS RELATED TO EDUCATION FACED BY ADOLESCENT STUDENTS

## (BASED ON A SAMPLE DRAWN FROM DUMBARA EDUCATIONAL ZONE IN THE CENTRAL PROVINCE IN SRI LANKA)

**K. P. W ආරියතිලක**

**Bcom, Dip.Ed. Distinction**

නිබන්ධන උපදේශක
මහාචාර්ය ජේ . ජයසූරිය මහත්මා

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපන දර්ශනපති උපාධියෙහි
අවශ්‍යතා පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත් කරන පර්යේෂණාත්මක
නිබන්ධනය
1998

523125

PERMANENT ... FO... LI...

## සාරාංශය

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ සිදුවන වේගවත් සමාජ ආර්ථික වෙනස්කම් ගමුවේ පාසල් පද්ධතියේ කේන්ද්‍රය වූ සිසුන් සිය ඉගෙනුම් – ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වන ඉගෙනුම් පරිසරය ද සංකීර්ණ එකක් බවට පත්වෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුහු සිය අධ්‍යාපනික කටයුතු වලදී විවිධාකාර ගැටළුවලට මුහුණ දෙති. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ නව යොවුන් විය පාසල් සිසුන් මුහුණපාන එවැනි අධ්‍යාපනික ගැටළු කවරේ ද යන්න අනාවරණය කර ගැනීමත් එම ගැටළු නිරාකරණය කර ගත හැක්කේ කෙසේද යන්නත් විමසා බැලීමය. මෙම කරුණට අදාළ වන වත්මන් ජාත්‍යන්තර ප්‍රවණතාවයන් වන්නේ අධ්‍යාපනික මාර්ගෝපදේශය හා උපදේශනය වැනි ගැටළු නිරාකරණය සඳහා ප්‍රයෝගී කර ගැනීමයි. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ විවිධ වර්ගයන්හි පාසල්හි ඉගෙනුම ලබන නව යොවුන් විය සිසුන් මුහුණපාන අධ්‍යාපනික ගැටළු නිරාකරණයෙහිලා අධ්‍යාපනික මාර්ගෝපදේශය හා උපදේශනය යොදාගත හැකි ආකාරය පිළිබඳව අවධාරණය කරයි.

මෙහිදී අධ්‍යයනය සඳහා මුළු දිවයිනම පාදක කර ගැනීම දුෂ්කර බැවින් පර්යේෂකයා විසින් මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දුම්බර අධ්‍යාපන කලාපය ඒ සඳහා තෝරා ගනු ලැබීය. එහි නව යොවුන් විය පාසල් සිසුන් ඉගෙනුම ලබන 1 ඒබී, 1 සී හා 2 වර්ගයේ පාසල් නියෝජනය වන පරිදි පාසල් 36 කින් සිසුන් 504 කගේ නියැදියක් පරීක්ෂාවට භාජනය කරනු ලැබීය. මෙම නියැදිය ස්ථරගත අහඹු නියැදියක් විය. මෙහිදී පාසල් සිසුන් මුහුණපාන අධ්‍යාපන ගැටළු ඔවුන්ගෙන් ම අනාවරණය කර ගැනීම පිණිස මූනි ගේ ගැටළු සැසඳුම් ලැයිස්තුව භාවිත කෙරිණ. එමගින් ලැබුණ තොරතුරුවල සත්‍යාසත්‍යතාව සනාථ කර ගැනීම සඳහාත් නව යොවුන් විය පාසල් සිසුන් මුහුණපාන අධ්‍යාපනික ගැටළු වැඩිදුරටත් හඳුනාගැනීම සඳහාත් නියැදිගත සිසුන්ගේ පංතිභාර ගුරුවරුන්, ගුරු උපදේශකවරුන් සහ දෙමාපියන් වෙතින් ප්‍රශ්නාවලි මගින් ද විදුහල්පති-වරුන් සහ විෂයමාලා සංවිධායකවරුන් වෙතින් ව්‍යුහගත සහ සම්මුඛ සාකච්ඡා මගින් ද ලබාගත් ප්‍රතිචාර විමසා බලන ලදී.

මෙමගින් නවයොවුන් විය පාසල් සිසුන් මුහුණපාන අධ්‍යාපනික ගැටළු ක්ෂේත්‍ර 10ක් හඳුනාගැනීමට හැකියාව ලැබුණ. එනම් ආර්ථික ගැටළු, ඉගෙනුම්–ඉගැන්වීම්

PERMANENT
FOR
LIB

ක්‍රියාවලිය ආශ්‍රිත ගැටළු, ඉන්ද්‍රිය සමෝධානය ආශ්‍රිත ගැටළු, භාෂා සහ සංනිවේදනය ආශ්‍රිත ගැටළු, චිත්තවේගයික ගැටළු, මානසික ගැටළු, අන්තර් පුද්ගල සම්බන්ධතා ආශ්‍රිත ගැටළු, පාසල් පිරියත ආශ්‍රිත ගැටළු, උපදේශනය ලබා ගැනීම ආශ්‍රිත ගැටළු සහ කායික ගැටළු යනුවෙනි. මෙම ගැටළු ක්ෂේත්‍ර තුළ අන්තර්ගත ගැටළු උපක්ෂේත්‍ර 47 ක් හඳුනා ගැනිණ. පාසල් වර්ග අනුවත්, ස්ත්‍රී පුරුෂ භාවය අනුවත්, මෙකී ගැටළු-වල බලපෑමේ ස්වභාවය පිළිබඳ වෙනස්කම් පවතින බවද පෙනී ගියේය.

මෙම අනාවරණ ඔස්සේ එළඹි නිගමනය වන්නේ ශ්‍රී ලංකාවේ නවයොවුන් විය පාසල් සිසුන්ට අධ්‍යාපනික ගැටළු පවතින බවයි. ඒවාට නිසි පිළියමක් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවේ. එබැවින් එවැනි ගැටළු නිරාකරණය සඳහා ගතයුතු ක්‍රියා මාර්ග යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ කාර්යභාරය ලෙස සලකා ඇත. ඒ සඳහා ලබින විකල්ප ක්‍රියාමාර්ගයන් වශයෙන් සෑම පාසලකම අධ්‍යාපනික මාර්ගෝපදේශ සහ උපදේශන සේවා ඒකකයන් පිහිටුවා ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පර්යේෂකයා අවධාරණය කරයි . ඒ සමඟම උක්ත ඒකකයේ ක්‍රියාකාරීත්වය සම්පූර්ණ කිරීමටත් එහි කටයුතු වගකීම-කින් යුතුව ක්‍රියාත්මක කිරීමටත් යෝග්‍ය අධ්‍යාපනික මාර්ගෝපදේශ හා උපදේශන සේවා ආයතනික ව්‍යුහයක් පිළිබඳ යෝජනා ද මෙහි ඇතුලත් වේ. මෙම අධ්‍යයනය විස්තරාත්-මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කරමින් සිදු කරන ලද්දකි. එසේ වුවද අවශ්‍ය විට සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම ද භාවිත කරන ලදී.

මේ අනුව මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය අධ්‍යයනයට අදාළ ගැටළුවේ පසුබිම විස්තර කරන අතර එහිලා අදාළ හා වැදගත් සංකල්ප පිළිබඳ අර්ථකථනයකින් ද යුක්ත වේ. දෙවන පරිච්ඡේදය මාතෘකාවට අදාල දේශීය සාහිත්‍යය මෙන්ම විදේශ සාහිත්‍යය ද විමසුමට ලක් කරයි. අධ්‍යාපනික ගැටළු නිරාකරණයෙහිලා අධ්‍යාපනික මාර්ගෝපදේශය හා උපදේශනය යොදා ගැනීමේ හැකියාව ඇති බව දක්වනු වන්නේ ඒ තුළිනි. එබැවින් තුන්වැනි පරිච්ඡේදය එම සංකල්පය හඳුනා ගැනීම සඳහා වෙන් කෙරිණ. මෙහිදී යෝජිත පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා පසුබිම් වන න්‍යායාත්මක පදනම විග්‍රහ කෙරේ. විශේෂයෙන් පාසල් තලයේ උපදේශන කටයුතු වලදී ආලෝකයක් ලබා දෙන උපදේශන සේවා න්‍යායයන් පිළිබඳව මෙහිදී ගැඹුරින්

විමසා බැලේ. සිවුවැනි පරිච්ඡේදයෙන් මෙම අධ්‍යයනයේ ජනගහනය, නියැදිය, පර්යේෂණ උපකරණ සහ පර්යේෂණ ක්‍රමවේදය දීර්ඝව විස්තර වෙයි. විශේෂයෙන් මෙම අධ්‍යයනයේ දී භාවිත කළ මූලික පර්යේෂණ උපකරණය වූ ගැටලු සැසඳුම් ලැයිස්තුව, ප්‍රශ්නාවලීන් හා ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මොඩියුල පිළිබඳ ඇතුළත් වේ. පස්වැනි පරිච්ඡේදය දත්ත විශ්ලේෂණය සඳහා වෙන්වී ඇත. ඒ තුළින් සිසුන් ගේ අධ්‍යාපනික ගැටලු වර්ගීකරණයක් සහිතව හඳුනා ගැනිණ. එම පරිච්ඡේදය අවසානයේ ඒ තුළින් උකහාගත් අනාවරණයන් දක්වයි. සයවැනි පරිච්ඡේදයෙන් එම අනාවරණයන් තුළින් එළඹිය හැකි නිගමනයන් ද ඒ නිගමනයන්ට අදාළ යෝජනාවන් ද ඉදිරිපත් කෙරේ. විශේෂයෙන් පාසල් තලයේ මාර්ගෝපදේශ සහ උපදේශන සේවාවන් කාර්යක්ෂම හා ඵලදායිතාවකින් යුතුව ක්‍රියාවට නැංවීම පිණිස අවශ්‍ය ආයතනික ව්‍යුහයක් එමගින් යෝජිතය. එසේම හඳුනාගත් අධ්‍යාපනික ගැටලු ක්ෂෙත්‍ර 10 සඳහා සහ ඒ එක් එක් ක්ෂෙත්‍රයන් තුළ අන්තර්ගත ගැටලු උපක්ෂෙත්‍රයන් ද තනි තනිව ගෙන ඒවා නිරාකරණයෙහි ලා සිසුන්ට මඟ පෙන්විය හැකි හා සහාය විය හැකි ආකාරයන් පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික යෝජනා මෙහි ඇතුළත් වේ.

මෙහිදී ශ්‍රී ලංකාවේ පාසල් තලයේ දක්නා ලැබෙන සියලුම වර්ගයේ පාසල් සඳහා අධ්‍යාපනික මාර්ගෝපදේශය හා උපදේශනයේ අවශ්‍යතාව අවධාරණය කිරීම මෙම අධ්‍යයනයේ විශේෂ යෝජනාවක් ද වන්නේ ය. එක් අතකින් මෙම අධ්‍යයනය, නූතනයේ බලවත් අර්බුදයකට පත්ව ඇති පාසලේ කටයුතු ඵලදායී මට්ටමකට ගෙන ඒමේ ක්‍රියා මාර්ගයකි. අනෙක් අතට සිසුන් වැඩි දෙනකුන් සඵල ඉගෙනුමක් වෙත යොමු කරමින් පොදුවේ සිසුන්ගේ සාධන මට්ටම වර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමකි. තවත් අතකින් සිසුනට ඉගෙනුමට පහසුකම් සපයමින් සාරවත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන්නකි.

එහෙත් මෙය සීමාවිය යුත්තේ නවයොවුන් විය පාසල් සිසුන් ඉගෙනුම ලබන ද්විතීයික පාසල් සම්බන්ධයෙන් පමණක් නොවේ. එබැවින් ප්‍රාථමික පාසල්, පිරිවෙන් සහ උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය තවදුරටත් මෙහෙයවීමේ ඉඩ ප්‍රස්තා පවතී.

PERMANENT ... FOR USE IN THE LIBRARY ONLY

## ABSTRACT

The environment in which the students, the centre of the school system, activate their Teaching - Learning process is becoming very complex due to dynamic socio-economic changes in Sri Lanka. As a result of this they have to face so many problems within the field of education. The main theme of the study is to identify the problems of adolescent students in Sri Lanka and to investigate solutions to those problems. The present international trend in finding solutions to these problems is the use of guidance and counselling. This study draws its attention on how to utilize guidance and counselling in order to solve educational problems of adolescents in different types of schools in Sri Lanka.

Taking into consideration the difficulties of an island wide research the current study is restricted to Dumbara educational division. A stratified random sample of 504 students was selected. These students came from 36 different schools of types 1 AB, 1C and 2A problem checklist similar to Mooney Problem Checklist is the main instrument used in collecting the data. In addition to this, questionnaires for class teachers, master teachers and parents and interviews with principals and curriculum designers are used as other instruments with the purpose of verifying the finding of the problem checklist and identifying more educational problems faced by adolescent students.

The different fields of problems related to education faced by adolescent students could be identified using above instruments. They are namely- economic problems, problems related to teaching - learning process, problems related to co-ordination of organs, problems of language and communication, emotional problems, mental problems, problems related to individual relationships, problems of school premises, problems of receiving guidance and physiological problems. Forty seven subdivisions of above fields were identified.

Revealings of the study show the existence of educational problems for adolescent students in Sri Lanka. Since there are not suitable remedial measures within the system of school, the study puts forward suggestions that would help to settle aforementioned problems. As a suitable alternative solution the researcher brings into attention installing units of educational guidance and counselling in every school. Suggestion for a higher organization which monitors activities of above units are also included in this report. This study has been conducted according to the descriptive research methodology, occasionally using statistical methods.

First chapter of the report introduces the background of the problem. A definition of important and relevant concepts is also included in it. Second chapter is devoted to the survey of previous native and foreign literature. Their findings reveal the capacity of applying guidance and counselling as a way of solving educational problems. In the third chapter relevant concepts are identified and the theoretical background of educational guidance and counseling is analyzed with a special attention paying to the counselling at school level. The fourth chapter describes in minute detail the population, the sample, research instruments and research methodology. Special attention was given to the problem checklist, questionnaires and schedules for interviews. The fifth chapter analyzes the data. Here the problems are categorized into different fields. Sixth chapter deals with the conclusions made upon the revealings of the study. A long list of suggestions is put forward with a view to create an institutional structure which helps in putting into action an efficient and productive guidance and counselling service at school level. Theoretical and practical suggestions which may help in solving problems of the major fields and sub fields are also included in this chapter.

The report stresses the necessity of introducing guidance and counselling service in all types of schools in Sri Lanka. In one hand this study is an attempt to bring the corrupted school activities to a productive level. On the other hand it is a development of teaching-learning process by directing students to a creative learning and thereby raising their levels of achievements, In another way it is a creation of fertile learning environment supporting students to learn well.

The report concludes by stressing the application of guidance and counselling at all levels in the formal educational system. Covering Primary, Higher and Pirivena Education.